# නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේ ගෘහනිර්මාණ සැකැස්ම හා පරිසරය පුද්ගල හැසිරීම් කෙරෙහි බලපාන අකාරය පිළිබඳ අධ්‍යයනයක්

බී.ඒ.එස්. ඉෂාරා - දේශපාලනවිද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය

අවකාශය වනාහි ස්ථානීය ස්වරූපය අනුව ගතිකමය ස්වභාවයක් ගනී. පර්යේෂණ අධ්‍යයන අවකාශය වන නිදහස් චතුරස්‍රය ආශ්‍රිත අවකාශයෙහි ද මෙකී ස්වරූපයක් දැකගත හැකිය. පශ්චාත් යටත්විජිත සමයේ සහ පශ්චාත් යුද සමයේ නිදහස් චතුරස්‍රය ආශ්‍රිත අවකාශයේ සිදුවූ නවීකරණ මගින් ජනවාර්ගික සහ පන්තිමය ධ්‍රැවීයකරණ සිදුවන බව දැක ගැනීමට හැකි විය. මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍ය කෘති, ලිපි, සටහන් සහ සිතියම් යනාදී වාස්තවික දත්ත භාවිත කෙරේ. සමාජයේ මතුපිටින් අවකාශ නිර්මාණයෙහි ඇති ආඛ්‍යාන හා සමාජ චර්යාවෙහි සංකීර්ණ භාවිතය තේරුම් ගැනීම සඳහා පශ්චාත් ප්‍රත්‍යක්ෂ ක්‍රම ලෙස සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණ විධික්‍රම භාවිත කරන ලදි. අධ්‍යයනය අනුව පශ්චාත් යටත්විජිත සමයේ සහ පශ්චාත් යුද සමයේ අවකාශ නවීකරණයෙන් ජනවාර්ගික සහ පන්තිමය ධ්‍රැවීයකරණයක් සිදුව ඇත. නිදහස් චතුරස්‍රය ආශ්‍රිත අවකාශ අධ්‍යයනයෙන් මනාව විශද වන කාරණය වන්නේ සිංහල - බෞද්ධ පදනමක් එහි අවකාශීය ව්‍යූහ නිර්මාණයට බලපා ඇති බවයි. යටත්විජිත සමයේ නිදහස් සටන් සඳහා සියලු ජනවර්ග සහභාගිවුවද නිදහස් සමරනු වස් නිදහස් චතුරස්‍රය නිර්මාණය කරනු ලැබුයේ එක් ජනවර්ගයක් පමණක් හුවා දැක්වෙන ආකාරයටය. පශ්චාත් යුද සමයේ නවීකරණ කරන ලද ආකේඩ් පරිශ්‍රයෙහි ද පන්තිමය ධ්‍රැවීයකරණයක් සිදුව ඇති ආකාරය දැකගත හැකිය. ඊට පෙර මෙම අවකාශය රාජ්‍ය පරිපාලන කටයුතු සඳහා භාවිත කරනු ලැබු ජනශුන්‍ය පෙදෙසක් විය. එම අවධියෙහි නාගරික සංවර්ධන අධිකාරිය යටතේ සුපිරි වෙළඳ සංකීර්ණයක් ලෙස නවීකරණය කරන ලදි. නිදහස් චතුරස්‍රය ආශ්‍රිත අවකාශය තුළ උදෑසන කාලයේ බහුල වශයෙන් ව්‍යායාම කරන පිරිස් දැකගත හැකිය. ඔවුහු වෙනත් පිරිස් සමඟ අන්තර්ග්‍රහණය ප්‍රතික්ෂේප කරති. මධ්‍යහ්න කාලයේ දී බහුල වශයෙන් තරුණ කොටස් එනම් පෙම්වතුන්, සමවයස් කණ්ඩායම්, විශ්වවිද්‍යාල පිරිස් මෙහි රැඳෙති. එම කාලයේ දී ව්‍යායාම කරන අයෙකු නිදහස් චතුරස්‍රය භාවිත කරන්නේ නම් ඔවුන් මධ්‍යහ්න කාලයේ දී එම පරිශ්‍රයට ආගන්තුක වේ. එක් එක් පුද්ගලයා සතු චර්යා, පුරුදු ස්වකීය චර්යාවේ අනිවාර්ය අංග ලෙස පුද්ගලයා සමඟ බැඳී පවතියි. මෙම භාවිතාවන් හුදෙක් තනි පුද්ගල භාවිතාවන් නොවන අතර සමාජ භාවිතාවන් බවට පත් වන්නේය. සමස්තය අනුව අවසාන වශයෙන් දැක්විය හැක්කේ නිදහස් චතුරස්‍රය ආශ්‍රිත අවකාශය වනාහි සමාජ අරගලකාරි වටපිටාවක් බවයි.

***ප්‍රමුඛ පද:*** *අවකාශය, අන්තර්ග්‍රහණය, බහිෂ්කරණය, දෘෂ්ටිවාදය, කතිකාව*